# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු සඳහා වන අයදුම්පත් 2026.08.03 දින හෝ එදිනට පෙර ලැබෙන සේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ආයතන හා සාමාන්‍ය පරිපාලන, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදගොඩ මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කරුණාකර අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කිරීමට වග බලා ගන්න.

අයදුම්පත්‍රය සහ වැඩිදුර විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියෙන් (https://pgim.cmb.ac.lk) ලබාගත හැක. නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කරන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ හෝ සුදුසුකම් සහ පළපුරුද්ද තහවුරු කරන සහතිකවල ඡායා පිටපත් ඇතුළුව අවශ්‍ය තොරතුරු නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබෙන අතර, ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිදු තත්වයක් යටතේ නැවත සලකා බලනු නොලැබේ.

### 01. කළමනාකරණ සහකාර තනතුර (III ශ්‍රේණිය) - තනතුරු 05

**සුදුසුකම්:**

1. පහත විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක්වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම
   - සිංහල/දෙමළ භාෂාව,
   - ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය,
   - ගණිතය

**සහ**

2. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එක්වරකදී (පොදු සාමාන්‍ය පරීක්ෂණය හැර) සියලුම විෂයයන්ගෙන් සමත් වී තිබීම. පැරණි නිර්දේශය යටතේ එක්වරකදී විෂයයන් 3කින් සමත් වීම මේ සඳහා ප්‍රමාණවත් වේ.
3. පහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් හට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.
   (අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්

**සහ**

   (ආ) පරිගණක යෙදුම් මෘදුකාංග භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්දක්

**වැටුප් පරිමාණය** : 2025.01.01 දිනට මසකට රු. 49,475 – 17X540 – 58,655 කි.

**තෝරාගැනීම** : පහත සඳහන් විෂයයන් සඳහා වන ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

- සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- පරිගණක සාක්ෂරතාවය

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

### 02. කාර්ය සහායක තනතුර (III ශ්‍රේණිය) - තනතුරු 01

### 03. පුස්තකාල සහායක තනතුර (III ශ්‍රේණිය) – තනතුරු 01

පහත නිර්ණායක ඉහත 02 සහ 03 තනතුරු සඳහා පොදු අවශ්‍යතා ලෙස අදාළ වේ:

**සුදුසුකම් :**

1. වාර දෙකකට නොවැඩි ගණනකදී සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**වැටුප් පරිමාණය** : 2025.01.01 දිනට මසකට රු. 42,775 – 16X450 – 49,975 [U PL 1(III)] කි.

**තෝරාගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### 04. කාර්ය සහායක තනතුර (රසායනාගාර සහායක ඇතුළුව) (III ශ්‍රේණිය) – තනතුරු 01

**සුදුසුකම්:**

1. වාර දෙකකට නොවැඩි ගණනකදී සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**වැටුප් පරිමාණය** : 2025.01.01 දිනට මසකට රු. 42,775 – 16X450 – 49,975 [U PL 1(III)] කි.

**තෝරාගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වෙනත් :**

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2026.07.12**